# HSBC සමූහ ව්‍යාපාරය සංස්ථාපිත පාලන වාර්තාවේ සාරාංශය

**පහත දක්වා ඇති තොරතුරු සහ යොමු මඟින් අන්තර්ගත කර ඇති තොරතුරු 2014 වාර්ෂික වාර්තාව හා ගිණුම්වල (‘වාර්ෂික වාර්තාව’) 263 සිට 299 දක්වා පිටුවල අඩංගු වූ HSBC සමූහ ව්‍යාපාරය (‘HSBC’) සංස්ථාපිත පාලන වාර්තාවේ සාරාංශයක් වේ.**

### අධ්‍යක්ෂක මණ්ඩලය

HSBC සමූහ ව්‍යාපාරය හි අධ්‍යක්ෂ මණ්ඩලය (‘අධ්‍යක්ෂ මණ්ඩලය’) විසින් මූලිකත්වය දරන හා සමූහ සභාපති වරයා විසින් මෙහෙයවෙන HSBC හි කළමනාකරණ ව්‍යුහයෙහි අරමුණ වන්නේ සමාගමෙහි දිගුකාලීන සාර්ථකත්වය ප්‍රවර්ධනය කිරීම සහ අපගේ කොටස් හිමියන්ට ස්ථාවර අගයක් ලබාදීමයි. සමූහය සඳහා ක්‍රමවේදයන් හා අවදානම් ගැනීම අධ්‍යක්ෂක මණ්ඩලය විසින් සිදුකරන අතර, කළමනාකාරීත්වය විසින් සැලසුම් කර ඇති ක්‍රමවේදී අරමුණු ලඟාකරගැනීම සඳහා එය විසින් ඉදිරිපත් කරන ප්‍රාග්ධන හා මෙහෙයුම් සැලසුම් අනුමත කිරීම ද සිදුකරයි. නියම කරන ක්‍රමවේදය ක්‍රියාත්මක කිරීම සමූහ කළමනාකාරීත්ව මණ්ඩලය (GMB) වෙත පැවරෙන අතර, සමූහ ප්‍රධාන විධායක විසින් ඒවා මෙහෙයවනු ලබයි.

### මණ්ඩලයෙහි බලතල

HSBC හි ව්‍යාපාර කටයුතු කළමනාකරණය කිරීම සම්බන්ධ අධීක්ෂණය අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම විය යුතු අතර, එසේ කිරීමේ දී අදාළ වන නීති හා රෙගුලාසිවලට සහ සාංගමික ව්‍යවස්ථාවලියට යටත්ව, සිය බලතල භාවිතා කරනු ඇත. මණ්ඩලය විසින් www.hsbc.com/1/2/about/board-of-directors, හි දැක්වෙන යොමු කොන්දේසි උපයොදවාගෙන ඇත. එම යොමු කොන්දේසි මණ්ඩලය විසින් වාර්ෂිකව සමාලෝචනය කරනු ලබයි.

### සමූහ කළමනාකාර මණ්ඩලය (GMB)

සමූහයේ ප්‍රධාන විධායක නිලධාරි විසින් GMB හි සභාපතිත්වය දරනු ලැබේ. එක් එක් ගෝලීය ව්‍යාපාරයන් හා ගෝලීය කටයුතුවල ප්‍රධානීන් සහ එක් එක් කලාපයේ ප්‍රධාන විධායක නිලධාරිවරු, සාමාජිකයකු වශයෙන් හෝ ආරාධනා මත හෝ, GMB රැස්වීම්වලට සහභාගි වේ. GMB හි අවදානම් කළමනාකරණ රැස්වීම්වල සභාපතිත්වය දරනු ලබන්නේ සමූහයේ ප්‍රධාන අවදානම් නිලධාරියා විසිනි. සමූහය තුළ අවදානම් කළමනාකරණය කිරීම සඳහා වන ප්‍රතිපත්ති සහ මඟපෙන්වීම් ස්ථාපනය කිරීමට, පවත්වාගෙන යාමට සහ කලින් කලට සමාලෝචනය කිරීමට අවදානම් කළමණාකරණ රැස්වීම් මගින් ක්‍රමවේදී මගපෙන්වුමක් හා ව්‍යවසාය පුරා සියලු අවදානම් කළමනාකරණය සඳහා අධීක්ෂණයක් සපයයි. සමූහය පුරා නිරතුරුව යොදාගත යුතු හා පිළිපැදිය යුතු වන යහ භාවිතයන් පිළිබිඹු කෙරෙන ගෝලීය ප්‍රමිතීන් සංවර්ධනය කිරීම හා ක්‍රියාවේ යෙදවීම ද අවදානම් කළමනාකරණ රැස්වීම මගින් සමාලෝචනය කෙරේ. සමූහයේ මූල්‍ය අපරාධ අනුකූලතා අංශ ප්‍රධානී සහ සමූහයේ මුදල් විශුද්ධිකරණ වාර්තාකිරීමේ නිලධාරියා ද අවදානම් කළමනාකරණ රැස්වීමේ මෙම කොටසට සහභාගි වේ.

### සමූහ විගණන කමිටුව (GAC)

මූල්‍ය වාර්තාකරණය ට අදාළව අධ්‍යක්ෂ මණ්ඩලය වෙත උපදෙස් දීම සහ පාලනය සම්බන්ධ විධායක නොවන අධීක්ෂණය සඳහා සමූහ විගණන කමිටුව ට විධායක නොවන වගකීම් පවතී.

### සමූහ අවදානම් කමිටුව (GRC)

ඉහළ මට්ටමේ අවදානම් හා සම්බන්ධ කරුණු පිළිබඳව සහ අවදානම් පාලනය සම්බන්ධව අධ්‍යක්ෂ මණ්ඩලයට උපදෙස් දීම සහ අවදානම් කළමනාකරණය සහ අභ්‍යන්තර පාලන පිළිබඳ විධායක නොවන අධීක්ෂණය සඳහා සමූහ අවධානම් කමිටුව වගකිව යුතු වේ (මූල්‍ය වාර්තාකරණය පිළිබඳව හැර).

### වැටුප් කමිටුව

වැටුප් ප්‍රතිපත්තිය අනුමත කිරීම සම්බන්ධයෙන් සමූහ වැටුප් කමිටුව වගකිව යුතු වේ. එහි කාර්යභාරයෙහි කොටසක් ලෙස ස්ථිර ගෙවීම්, වාර්ෂික දීමනා සැලසුම්, කොටස් සැලසුම්, වෙනත් දිගුකාලීන දීමනා සැලසුම්, ප්‍රතිලාභ හා විධායක අධ්‍යක්ෂවරුන්ගේ හා වෙනත් ජ්‍යෙෂ්ඨ සමූහ සේවකයන්ගේ තනි පුද්ගල වැටුප් පැකේජ එය විසින් සලකා බලන අතර, එසේ කිරීමේ දී සමූහයේ පවතින ගෙවීම් සහ තත්ත්වයන් සලකා ද බලයි. ස්වකීය වැටුප තීරණය කිරීම සඳහා කිසිදු අධ්‍යක්ෂවරයෙකු සම්බන්ධ නොවේ.

### නාමකරණ කමිටුව

නාමකරණ කමිටුවේ මූලික වගකීම වන්නේ අධ්‍යක්ෂක මණ්ඩලයේ ශක්‍යතාවයන්, දැණුම, අත්දැකීම්, විවිධත්වය හා ස්වාධීනත්වයෙහි යෝග්‍ය සමතුලිත තාවයක් පවත්වා ගැනීම සහතික කිරීමයි.

### චර්යා සහ වටිනාකම් කමිටුව

චර්යා සහ වටිනාකම් කමිටුව 2014 ජනවාරි මස ස්ථාපිත කරන ලද්දේ, චර්යාත්මක ප්‍රමිතීන් ඉහළ දැමීමට හා සමූහය පෙනී සිටින චර්යා අගයයන් අන්තර්ගත කිරීමට සමූහය දරන බහුවිධ උත්සාහයන් සම්බන්ධව අධ්‍යක්ෂ මණ්ඩලයට දැක්මක් ලබා දීම සඳහා ය. පාරිභෝගිකයින් සඳහා නිසි ප්‍රතිඵල ලබාදීම සහ වෙළඳපොල විශ්වාසනීයත්වය පවත්වා ගැනීම තිරසාර සහ ලාභදායී ව්‍යාපාරයක ඉහළම ගාමක බලවේගයන් වේ. ඊට අමතරව මෙම කමිටුව විසින්, HSBC බැංකුව විසින් එය ක්‍රියාත්මක වන ජනසමාජය වෙත වගකීමක් සහිතව ක්‍රියා කරන බවට සහතික වීම සඳහා, දැන් අහෝසි වී ඇති ව්‍යාපාර තිරසාරභාවය පිළිබඳ කමිටුව වෙතින් උරුම කරගත් තිරසාර භාවය සම්බන්ධව එහි වගකීම් ද දරනු ඇත.

### අභ්‍යන්තර පාලන

HSBC හි අවදානම් කළමනාකරණය සහ අභ්‍යන්තර පාලන පද්ධතියෙහි සඵලතාවය පවත්වාගෙන යාම සහ සමාලෝචනය කිරීම පිළිබඳව මෙන් ම ක්‍රමෝපාය අරමුණු සාක්ෂාත් කරගැනීමේ දී මුහුණ දීමට සූදානම් වන සැලකිය යුතු අවදානම්වල ස්වභාවය හා ප්‍රමාණත්වය නිශ්චය කිරීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරු වගකිව යුතු වේ. මෙම අවශ්‍යතා සපුරාලීමට හා FCA සහ PRA විසින් නිර්මාණය කර, නිකුත් කරන ලද අත්පොත යටතේ දක්වා ඇති සිය වගකීම් ඉටුකිරීම සඳහා ද, අවසර නොලත් භාවිතය හෝ බැහැර කිරීම් වලට එරෙහිව වත්කම් ආරක්ෂා කිරීම සඳහා ඇති කාර්ය පටිපාටි, නිසි පරිදි ගිණුම්කරණ වාර්තා පවත්වාගෙන යාම සහ ව්‍යාපාරය තුළ භාවිත කරනු ලබන හෝ ප්‍රකාශයට පත්කරනු ලබන මූල්‍ය තොරතුරුවල විශ්වාසනීයත්වය හා වැඩදායක බව සහතික කිරීම එමගින් සිදු කළ යුතු වේ. මෙම කාර්ය පටිපාටීන් මගින් භෞතික අවප්‍රකාශ, දෝෂ, හානි හෝ වංචාවලට එරෙහිව සාධාරණ නමුත් ඒකාන්ත නොවන ආරක්ෂණයක් පමණක් සැපයිය හැකි ය.

### මූල්‍ය වාර්තාකරණය

2014 වසරේ සංයුක්ත වාර්ෂික වාර්තාව හා ගිණුම් සැකසීම සඳහා වන සමූහයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාදාමය, සෑම වාර්තාකරණ කාලසීමාවක් ම අවසාන වීමට පෙරාතුව සමූහ මූල්‍ය අංශය විසින් සමූහය තුළ ඇති සියලුම වාර්තාකරණ ආයතන වෙත නිකුත් කරනු ලබන වාර්තාකරණ අවශ්‍යතා සම්බන්ධව සවිස්තර උපදෙස් හා මඟපෙන්වීම් සහිත ගිණුම් වගුවකින් සහාය ලැබෙන ලේඛනගත ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිතයෙන් පාලනය වේ. එක් එක් වාර්තාකිරීමේ ආයතන විසින් සමූහ මූල්‍ය අංශයට මූල්‍ය තොරතුරු ඉදිරිපත් කිරීම අදාල වගකිවයුතු මූල්‍ය නිළධාරියා විසින් සහතික කිරීමට ද, වාර්තා කිරීමේ ආයතන හා සමූහ මට්ටම්වල දී විශ්ලේෂණාත්මක සමාලෝචනයට ද යටත් වේ.

### හෙළිදරවු කිරීමේ කමිටුව

HSBC සමූහ ව්‍යාපාර විසින් කිසියම් භෞතික දෝෂයක්, අවප්‍රකාශයක් හෝ මගහැරීමක් සම්බන්ධයෙන් සිදු කරන ලද ප්‍රසිද්ධ භෞතික හෙළිදරව් කිරීම්, හෙළිදරව් කිරීමේ කමිටුව විසින් සමාලෝචනය කරනු ලබයි. සමූහයේ සමාගම් ලේකම්වරයා විසින් සභාපතිත්වය දරන හෙළිදරව් කිරීමේ කමිටුවේ සාමාජිකත්වයට ග්ලෝබල් ෆිනෑන්ස් හි ප්‍රධානීන්, නීති, අවදානම් (මූල්‍ය අපරාධ අනුකූලතාව සහ නියාමක අනුකූලතාව ඇතුළුව), සන්නිවේදන, ආයෝජන සබඳතා සහ අභ්‍යන්තර විගණන කාර්ය සහ ප්‍රධාන කලාප සහ ගෝලීය ව්‍යාපාරවල නියෝජිතයන් ද ඇතුළත් වේ. හෙළිදරව් කිරීම්වල පූර්ණත්වය, ගෝලීය ව්‍යාපාරයන්, ගෝලීය කාර්යයන් සහ ඇතැම් නෛතික ස්ථිතීන් හී ප්‍රධානීන් විසින් ඌණපූරණය කරමින් සහතික කළ උග්‍ර විශ්ලේෂණාත්මක මූල්‍ය වාර්තාකරණ විශේෂඥ සමාලෝචනයන්ගේ සහය සහිතව ගෝලීය මූල්‍ය සහ අවධානම් කාර්යය පටිපාටීන් සහ ව්‍යුහයන් තුළින් තහවුරු කෙරේ.

HSBC

ද හොංකොං ඇන්ඩ් ෂැංහයි බැන්කින් කෝපරේෂන් (ලිමිටඩ්) යනු ශ්‍රී ලංකා මහ බැංකුවේ අධීක්ෂණය යටතේ පවතින ලියාපදිංචි බලපත්‍ර ලාභී වාණිජ බැංකුවකි.
ශ්‍රී ලංකාවේ ද හොංකොං ඇන්ඩ් ෂැංහයි බැන්කින් කෝපරේෂන් (ලිමිටඩ්) විසින් නිකුත් කරන ලදී. AAA (lka) ෆිච් සහතිකයක් ලබා ඇත.